## කන්තලේ ප්‍රාදේශීය සභාව
## ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කන්තලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක ඇප ලෙස ස්ථාවර තැන්පතුවල රඳවා ඇති රු.18,000 ක මුදල ගිණුම්වලින් මඟහැරී තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | ස්ථාවර තැන්පතු වල රඳවා ඇති නමුත් ගිණුම් වලින් මගහැරී තිබූ සේවක ඇප මුදල් 2019 ගිණුම් ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. |
| (ආ) | 2018 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2018 අගෝස්තු 13 සහ 15 යන දිනවල එළඹී ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම් 02 කට අදාළව ගෙවිය යුතු හා ලැබිය යුතු රු.1,619,761 ක් ණයගැති හා ණයහිමි ගිණුම්වලින් මඟහැරී තිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කළ යුතුය. | 2018 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන (PSDG) ව්‍යාපෘතිය මඟින් ප්‍රතිපාදිත මෙම ඉදිකිරීම් කටයුතු සිදු වු අතර ඒ සඳහා 2018 වර්ෂය තුළ කිසිදු මුදල් ලැබීමක් හෝ ගෙවීමක් සිදු නොවු බැවින් මෙම ගනුදෙනුව සම්පූර්ණයෙන් ගිණුම්ගත නොවී තිබුණි. 2019 වර්ෂය සඳහා අවසන් ගිණුම් සකස් කිරීමේදී මෙය ගිණුම් ගත කිරීමට කටයුතු කළ හැකිය. |
| (ඇ) | පුටු 600 ක් මිලට ගැනීම සඳහා රු.1,467,000 ක වියදමක් දරා තිබුණද රු.467,000 ක් ලෙස දැක්වීමෙන් ලී බඩු හා සවිකිරීම් උපකරණ රු.1,000,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | අවසන් ගිණුම් වල ලීබඩු හා සවිකිරීම් උපකරණ යටතේ 467,000 ක් ලෙස පෙන්වා දීම පරිගණක ගත කිරීමේදී සිදු වූ දෝෂයක් බැවින් එම හිඟ මුදල ජ'නල් සටහන් මගින් 2019 |

| | | | |
|---|---|---|---|
| | | | වර්ෂයේ අවසන් ගිණුම් ප්‍රකාශයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2018 වසරේදී ලංකා බැංකුවේ තැන්පත් කරන ලද රු.2,000,000 ක් වූ ස්ථාවර තැන්පතුව ගිණුමෙන් මගහැරී තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ප්‍රමාද දෝෂයකින් අපගේ ගිණුම්වලට ඇතුලත් කර නොමැත. ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව පෙන්වා දෙමි. |
| (ඉ) | පන්සල් ගොඩැල්ල ක්‍රීඩා පිටියේ රු.499,990 ක වියදමින් ඉදිකළ ක්‍රීඩාංගණයේ වටිනාකම ස්ථාවර වත්කම් ගිණුමෙන් මගහැරී තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පන්සල්ගොඩැල්ල ක්‍රීඩාංගනයේ රු.499990/- ක වියදමින් ඉදිකළ ක්‍රීඩාගාරයේ වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු යොදා ඇත. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ හිටි වරිපනම් ශේෂය රු.9,471,046 ක් වුවද එය රු.9,154,410 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.316,636 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කර ගත යුතුය. | ලබාදුන් තොරතුරු නිවැරදි වන අතර එය ජර්නල් සටහනකින් නිවැරදි කළ හැකිය. |

## 1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.240,473,768 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාලව විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස සංනිරීක්ෂණය/ සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | විෂයන් 09ක් පිළිබඳව විස්තරාත්මක උප ලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරියේදී ඉදිරිපත් කිරීමට පියවර ගැනේ. |

1.4 අනුකූල නොවීම

1.4.1 නීතී, රීතී. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීතී, රීතී. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | මාර්ග ඉන්වේන්ට්‍රිගත කර නොතිබූ අතර පැවති මාර්ග සහ ඉදිකළ සියලු මාර්ග වගන්ති ප්‍රකාරව ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිගත කිරීම හා ගැසට් පත්‍රයේ පල කළ යුතු වේ. | සභාව විසින් නව මාර්ග ලැයිස්තුව සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර මෙම වර්ෂය අවසානයේදී එම කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වේ. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීතී මාලාව | | | |
| | (i) 217 වැනි රීතිය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත් කාලීන කරන බව දැනුම් දෙමි. |
| | (ii) 218 වැනි රීතිය | සියලුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කළ යුතු වේ. | සියළුම ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදය 3.15 | සේවක ණය ලබා දීමේදී ඇපබැඳුම්කර අත්සන් කිරීම සඳහා පොදු 158 ආකෘතිය භාවිතා නොකර අවස්ථා 13 කදී රු.1,300,000 ක සේවක ණය ලබා දී තිබුණි. | පොදු ආකෘති පත්‍ර 158 භාවිතා කර සියළුම ආපදා ණය සඳහා ඇපකරය අත්සන් | ඇපබැදුම්කර අත්සන් කිරීම සඳහා පොදු 158 ආකෘතිය භාවිතා කල යුතු වුවද, වෙනත් ආකෘතියක් භාවිතා කල අතර, අදාල නිලධාරීන්ගේ නිවැරදි (පොදු 158) ආකෘති |

| | | | |
|---|---|---|---|
| | | කරවා ගත යුතුය. | පත්‍රය සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (i) මුදල් රෙගුලාසි 880 | ඇප තැබිය යුතු නිලධාරීන් 05 දෙනෙකු ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2019 අගෝස්තු මස අවසන් වීමට පෙර ඇති සේවක ඇප තැම්පතු අයකර ගැනීමට කටයුතු යොදා ඇත. |
| (ii) මුදල් රෙගුලාසි 1645 (ආ) සහ 1646 | වාහන 17 ක ධාවන සටහන් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙතෙක් යවා නොමැති අතර 2019 ජනවාරි මස ධාවන සටහන් විස්තර ඔබ වෙත යොමු කර ඇත. තවද යැවිය යුතු ඉතිරි මාසවල තොරතුරු 30 වන දිනට ප්‍රථමව ලබාදීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.2,547,663 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,878,731 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු,000 | රු,000 | රු,000 | රු,000 | රු,000 | රු,000 | රු,000 | රු,000 |
| වරිපනම් හා බදු | 2,288 | 2,323 | 2,223 | 9,009 | 4,300 | 3,759 | 3,830 | 9,471 |
| කුලී | 16,650 | 4,913 | 3,159 | 1,774 | 15,625 | 4,976 | 8,294 | 2,881 |
| වෙනත් ආදායම් | 2,725 | 2,725 | 1,266 | 11,810 | 8,160 | 12,070 | 6,891 | 10,906 |

2.2.2 මුද්දර ගාස්තු

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුද්දර ආදායම් හිඟ ලෙස ඇස්තමේන්තු වටිනාකමත් සත්‍ය වටිනාකමත් අතර වෙනස ගිණුම්ගත කිරීමෙන් රු.10,320,598 ක ව්‍යාජ මුද්දර හිඟ ආදායමක් ගිණුමේ පෙන්නුම් කර තිබුණි. | වර්ෂයට අදාළ මුද්දර ගාස්තු හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතු වේ. | ඇස්තමේන්තු සකස් කිරීමේදී මුද්දර ගාස්තු වසර ගණනාවක් තිස්සේ අධි තක්සේරු කර ඇත. ඒ අනුව 10,320,598 ක මුදලක් හිග ආදායම් ලෙස අවසාන ගිණුමේ පෙන්නුම් කරනු ලබයි. එය ජර්නල් සටහන් මඟින් ඉවත් කර ගැනීම සඳහා කටයුතු කරන බව දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කාර්යය සාධනය

---------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුබසාධනය යන කාර්යයන් සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 11 කට අදාළව 2013 වර්ෂයේ දී සකස් කර තිබූ අතුරු ව්‍යවස්ථා අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා 06 ක් සම්මත කර ගැනීමට නැගෙනහිර පළාත් දෙපාර්තමේන්තුවට යොමු කර තිබුණ ද ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණත් එය නැවත සක්‍රීය කිරීමට කටයුතු කරන බවට පළාත් පාලන කොමසාරිස් 2019.05.09 දිනැති ලිපියෙන් දන්වා ඇත. ඉතිරි අතුරු ව්‍යවස්ථා ද අනුමත කර ගැනීමට කටයුතු කරමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අයවැය කෙටුම්පත් කිරීම, සඳහා පමණක් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් මාසිකව එකතු වන කසල ටොන් 150 ක් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අනුව බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. කසළ බැහැර කිරීම සඳහා මහවැලි අධිකාරිය විසින් සූරියපුර ප්‍රදේශයෙන් ලබා දී තිබූ අක්කර 12 ½ ක ඉඩම වටා විදුලි වැටක් සවිකර විධිමත්ව කසළ බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අනුව කසල බැහැර කළ යුතුය. | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනය වල සියලුම අපද්‍රව්‍යයන් විධිමත්ව බැහැර කිරීමට ගිවිසුම් සහිතව යොමු කරවන ලදී. නමුත් එම ආයතනය අක්‍රිය වීය. ඒ වන විට මධ්‍යම පරිසර අධිකාරිය සමඟ පිළිසරු ව්‍යාපෘතිය යටතේ කන්තලේ සූරියපුර සඳහා රුපියල් මිලියන 10 ක කොම්පෝස්ට් අංගනයක් සහිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීමට අනුමත කර තිබුණි.<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ඉහත පළාත් පාලන ආයතනය සමඟ අපද්‍රව්‍ය බැහැර කිරීමට එකඟ වු බැවින් අනුමත පිළිසරු ව්‍යාපෘතිය අත්හිටුවන ලදී.<br>පළෘත් පාලන ආයතනය ප්‍රාදේශීය සභාව විසින් දෛනිකව එකතු කරනු ලබන අපද්‍රව්‍ය ලබා නොගැනීම හේතුවෙන් එම |

| | | |
|---|---|---|
| | | අපද්‍රව්‍ය සුරියපුර ඉඩමට බැහැර කරනු ලැබේ. මේ වනවිට නව කසල අංගනයක් එම සුරියපුර ඉඩමේ ඉදිකිරීම සඳහා වු යෝජනාව පළාත් පාලන අමාත්‍යාංශයට හා පරිසර අධිකාරිය වෙත නැවත යොමු කර ඇති අතර එම යෝජනාව අනුමත වු විගස කඩිනමින් විදුලි වැටක් සවිකර විධිමත්ව කසළ බැහැර කිරීමට කටයුතු කළ හැකිය. |

(ඇ) පාරිසරික ගැටළු

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2000 අංක 53 හා 1998 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනතට අනුකූලව පරිසර හානි සිදුවන වඩු කර්මාන්තය, බ්ලෝක් ගල් නිෂ්පාදනය හා වීමෝල් ආදි ව්‍යාවසායන් සම්බන්ධව සමීක්ෂණයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පරිසරයට හානි සිදු වන ව්‍යවසායන් පිළිබඳ වාර්ෂිකව සමීක්ෂණය සිදු කර බලපත්‍ර ලබාදිය යුතුය. | 2019 වර්ෂය සඳහා සභා බල ප්‍රදේශය තුළ පරිසර ආරක්‍ෂක බලපත්‍රය ලබා ගත යුතු ව්‍යවසනයක් පිළිබඳ සමීක්‍ෂණයක් සිදු කරමින් පවතී. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ඇතුළත් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්නායක හඳුනාගෙන නොතිබුණි. ඒ පිළිබඳ ප්‍රමාණවත් දැනුවත්භාවයක් ලබාගෙන නොමැති වීම හේතුවෙන් කිසිඳු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට | අදාළ නීති රීති චක්‍රලේඛ උපදෙස් අනුකූලව තිරසාර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුවේ. | පළාත් පාලන අමාත්‍යංශය හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ විධිමත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර හෝ දැනුවත් කිරීමක් මෙතෙක් සිදු කර නොමැත. තිරසාර සංවර්ධනය පිළිබඳ මුලික අඩිතාලම |

| | | |
|---|---|---|
| සභාව අපොහොසත්ව තිබුණි. | | අදාළ පාර්ශව ලබා දෙන්නේ නම් ඒ සඳහා දායක විය හැකිය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවය හැර ගිය හා සේවයෙන් ඉවත් කළ සේවකයන් හතර දෙදෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.1,259,195 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | ආයතන සංග්‍රහයේ ...... පරිච්ඡේදයේ 04 වගන්තිය අදාළ වන්නේ සේවය අවසන් කල හෝ විශ්‍රාම ගිය නිලධාරීන් සඳහාය. නමුත් පහත සඳහන් අයගේ සේවය අවසන් කල හෝ විශ්‍රාම ගන්වා නොමැති අතර ඔවුන්ගේ සේවය තාවකාලිකව අත්හිටුවා ඇත්තේ පහත සඳහන් හේතුන් මතය. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයුර්වේද බෙහෙත් ශාලාවේ දැඩි ඖෂධ හිඟයක් වර්ෂය පුරා පැවතුණි. | අවශ්‍ය පරිදි ඖෂධ තොග හිඟයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතු වේ. | ඖෂධ මිලදී ගැනීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කර නොතිබීම හේතුවෙන් ඖෂධ මිලදී ගැනීමට නොහැකි වී තිබූ අතර ප්‍රතිපාදන අනුව ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ ඉල්ලීම් සඳහා ඖෂධ වර්ග ලබා දී ඇත. නමුත් 2019 වර්ෂයේදී රුපියල් ලක්ෂ දහයක ප්‍රතිපාදන වෙන් කිරීම හේතුවෙන් ඖෂධ හිඟයක් ඇති නොවන පරිදි මිලදී ගැනීමට හැකියාව ඇති බව දන්වමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාර් රථයක් අවුරුදු 10 අධික කාලයක සිට ද ට්‍රැක්ටර් ට්‍රේලර් 02 ක් වසර 05 කාලයක සිට ද විනාශ වීමට ඉඩහැර තිබුණි. | විනාශ වීම වලක්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | කාර් රථය අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන බැවින් ගර්භිත ලෙස මුදල් ලැබුණු පසුව ට්‍රැක්ටර් ටේලර් රථ දෙක අලුත්වැඩියා සිදු කරමි. |

3.4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාත්මක මට්ටමක පැවතියද Print Out ලබා ගැනීමට නොහැකි යැයි පවසා එහි පැමිණීම පිටවීම සටහන් නොකර නිෂ්කාර්යව සවිකර තිබුණි. | වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල ආයතනයට දන්වා තිබුනද, මේ වනතෙක් වාර්තා කර නැත. 2019 ජුනි 01වන දා වන විට සකස් කිරීමට පියවර ගනිමි. |

3.4.3 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වසරේ අබලි ද්‍රව්‍ය වෙන්දේසියේදී ඉවත් කරන ලද අයිතම 26 කට අදාළ වත්කම්වල පිරිවැය ස්ථාවර වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිරිවැය ගණනය කර ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේදී වෙන්දේසි කරන ලද අබිලි ද්‍රව්‍ය ජර්නල් සටහනක් මගින් ඉවත් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුස්තකාලවලින් ඉවත් කරන ලද පොත් 77 ක පිරිවැය පුස්තකාල පොත් වටිනාකමින් ඉවත් කර නොතිබුණි. | පිරිවැය ගණනය කර ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

3.4.4 වාහන උපයෝජනය

--------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------------- | ---------------- | -------------------------- |
| (අ) | වාහන 04 ක් සඳහා රක්ෂණ ආවරණද, වාහන 12 ක් සඳහා 2018 වර්ෂය සඳහා ආදායම් බලපත්‍රයද ලබා ගෙන නොතිබුණි. | වාහන ආදායම් බලපත්‍ර අළුත්කරවා ගැනීමට හා රක්ෂණාවරණ ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම සභාවට අයත් රථවාහන සඳහා දීර්ඝ කාලයක සිට ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබු අතර එම වාහන වල බලපත්‍ර ලබා ගැනීමට පූර්ණ කටයුතු සංවර්ධනය කරන ලදී. නමුත් වසර ගණනාවක සිට බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් විශාල වියදමක් දැරීමට සිදුව ඇත. ඒ සඳහා යම් සහනයක් ලබා දෙන ලෙස නැගෙනහිර ගරු ආණ්ඩුකාරතුමා වෙත හා ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම් කර ඇත. එහි සහනයක් ලැබුණු පසු හෝ 2020 ප්‍රතිපාදන ඇතුලත් කර මෙම කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වෙමි. |

3.5 ප්‍රසම්පාදනය

----------------

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | -------------------- |
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වේ. | 2019 ඉදිරි කාර්තුව සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සැකසීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

3.5.2 සැපයීම් හා සේවා

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 (අ) ප්‍රකාරව තාක්ෂණ ඇගයීම් කමිටුවේ වාර්තා ප්‍රසම්පාදන අත්පොතේ අඩංගු නිශ්චිත ආකෘතියට අනුව වාර්තාගත කර නොතිබුණි. | තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා පවත්වාගෙන යා යුතු වේ. | ප්‍රසම්පාදන අත්පොතේ අඩංගු නිශ්චිත ආකෘතියක් නොතිබුණු අතර ඉදිරියේ දී එවැනි ලේඛනයක් නඩත්තු කරන බව දැනුම් දෙමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2009 /6/09 DMA/2009 (i)දරන චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතු වේ. | ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර ඇත. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2009/6/09 දිනැති අංක DMA/2009 (i) දරන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව රැස්කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වේ. | 2019/05/23වන දින ප්‍රාදේශීය සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටුව රැස් කර කමිටුව පවත්වන ලදි. |

4.3 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

---

(අ) නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පසුගිය වර්ෂවල වාර්තාවෙන් පෙන්වා දුන් නිරීක්ෂණ ගිණුම්වලට ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්වලට ගැලපීමට කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේ දී විගණනය පෙන්වා දෙන ලද සියලු ගැලපීම් ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. |